# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2163/25 - 2020 පෙබරවාරි මස 20 වැනි බ්‍රහස්පතින්දා - 2020.02.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 5/2011(ii)

**2008 අංක 40 දරන ජාතික මංමාවත් පනත**

11 වන වගන්තිය යටතේ නියමය

2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 11 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මාර්ග සහ මහාමාර්ග අමාත්‍ය, ජොන්ස්ටන් ෂේවියර් ප්‍රනාන්දු වන මා විසින්, ඉහත කී පනතේ 9 වන වගන්තිය යටතේ සාදන ලදුව 2020 පෙබරවාරි මස 18 වන දිනැති අංක 2163/15 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් "අධිවේගී මහා මාර්ගයක්" බවට නම් කරන ලද සහ මේ නියමයේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති "දක්ෂිණ ජාතික මහා මාර්ගය (කොට්ටාව - මත්තල)" මේ නියමය මගින්, ගාස්තු ගෙවිය යුතු මහා මාර්ගයක් ලෙස ප්‍රකාශ කරනු ලැබේ.

ඉහත කී පනතේ 11 වන වගන්තිය යටතේ සාදන ලදුව,

(1) දකුණු දිග ජාතික මහා මාර්ගය ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයක් ලෙස ප්‍රකාශයට පත් කරමින් 2011 නොවැම්බර් මස 08 වන දිනැති අංක 1731/2 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය ;

(2) ගාල්ල - මාතර ජාතික මහා මාර්ගය ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයක් ලෙස ප්‍රකාශයට පත් කරමින් 2014 පෙබරවාරි මස 19 වන දිනැති අංක 1850/33 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය ;

(3) ගොඩගම - කසාගල ජාතික මහා මාර්ගය (දක්ෂිණ අධිවේගී මාර්ග කොටස) ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයක් ලෙස ප්‍රකාශයට පත් කරමින් 2019 නොවැම්බර් මස 09 වන දිනැති අංක 2148/62 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය ; සහ


1A - PG 4886— 117 (2020/02)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www. documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(4) බරවකුඹුක - මත්තල ජාතික මහා මාර්ගය (දක්ෂිණ අධිවේගී මාර්ග කොටස) ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයක් ලෙස ප්‍රකාශයට පත් කරමින් 2019 නොවැම්බර් මස 08 වන දිනැති අංක 2148/44 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය,

ඒ යටතේ කලින් සිදු කරන ලද කිසිවකට අගති විරහිතව මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලැබේ.

**ජොන්ස්ටන් ෂේවියර් ප්‍රනාන්දු,**
මාර්ග සහ මහාමාර්ග අමාත්‍ය.

2020 පෙබරවාරි මස 19 වැනි දින,
බත්තරමුල්ලේ දී ය.

**උපලේඛනය**

ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගය සමන්විත වන ප්‍රදේශය

දක්ෂිණ අධිවේගී මහා මාර්ගය (කොට්ටාව - මත්තල) ලෙස නම් කර ඇති අධිවේගී මහා මාර්ගයේ කොට්ටාව (කි.මී. 0.000) සහ මත්තල (කි.මී. 200.451) අතර පිහිටා ඇති කිලෝමීටර් 200.451 ක් දිගින් සහ මීටර් 70,000 - 100.000ක් පළලින් යුතුව විහිදෙන මාර්ග කොටස වේ.

03 - 135

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.